# 16

"තාත්තා ගෙදරින් ගිහින් දවස් තුනක්ම ගියා නේද පුතේ ?" සුදා බිමල්ගෙන් ඇසුවාය.

"හ්ම් -"

බිමල් වෙනත් කල්පනාවක.

"ඇයි අපිට කතා කරන්නෙ නැත්තෙ ?"

"ම් ?"

බිමල්ට ඇසුණේ 'කතා කරන්නෙ නැත්තෙ?' යන්න පමණි.

බිමල් සිටියේ ඉස්තෝප්පුවේ හිඳගෙන මිදුල දෙස බලාගෙනය. ගස් කොලන් වලට ඉහලින් වතුර වලාකුළක මුහුන පෙනේ. ඈත අහසේ වලාරොද කීපයක් සෙමින් ගලා යයි. තමාගේ ජීවිතයේ අරමුණ කුමක්දැයි ඔහුට සිතෙයි.

බිමල්ට දැන් දහ අටයි. විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල එනතුරු බලා සිටිනා ඔහුට ඒ ලැබෙන තුරු විවේකයක් ගන්නට බැරිකමක් මෙනි. තම ජීවිතයේ සාර්ථක සන්ධිස්ථානයකට පැමිණි ඇතුමක් මෙන ඒ ජීවන ගංඟාවේ රතු මල් දැල් වී තිබේ. කොල පැහැ එළිය වලාවෙන් කොයි පැත්තට දැයි නොදැන හැරෙන්නට බැරුවාක් මෙනි.

"පුතේ !" සුදා දොර සෙරෙප්පු අද්දමින් ඉස්තෝප්පුවට ආවාය.

"ම් ?"

"ඇහුනෙ නැද්ද? මිස්ට අතුකෝරලට කතා කරල අපේ අයියන්මාට එක කිව්ව ඉවර වෙන්නෙ කියලා."

"මං තාත්තගෙ ෆෝන් එකට කතා කළා නෙ. ඒකෙ කියන්නෙ ක්‍රියා විරහිතයි කියලා."

"ඒක තමයි."

බිමල්ට, තාත්තා වැඩ කරන ප්‍රවෘත්ති පත්‍රයේ ප්‍රධාන කර්තෘ අතුකෝරලට කතා කරන්නට සිත් දුන්නේ නැත. අතුකෝරල මිනිසුන් පාලනය කිරීමේදී ආඩම්බරයක් ලබන්නෙකැයි තාත්තා වරක් කියූ දෙය බිමල්ගේ සිතට නැවුම් තිබිණි. බිමල්ට උවමනා නම් ප්‍රවෘත්ති සුලු දේකියාවක්, තාත්තාගේ මාගියෝ ලබාගන්නට තිබිණි. එහෙත් තාත්තා නැති බිමල්ට ඒ ඔස්සේ උනන්දුව තොරවේ නැත.

" තාත්තා වගේ පත්තරේට ලිය ලියා ඉන්නද ආසාව

තියෙන්නෙ ?' යැයි කෙනෙක් ඇසුවිට එයට ස්ථිරසාර පිළිතුරක් දෙන්නට බිමල්ට කිසිවිටෙක නොහැකිවිය.

"පන්නර කළත් වැඩක් නෑ" අම්මා නිතර කීවාය. "කෝ මේ මනුස්සයට හරියට කෑම කටක් කන්නවත් වෙලාවක් තියෙනවැ ?" කාන්තා ගැන කියද්දී අම්මා කියන්නේ එසේය.

සුමනා බිමල්ට උපන්දා කොහොමේ වීදුරු අංශයෙනි. දැන් ඇයගේ විවාහ නැවුමට පරිහණිකය කෙරෙන්නීය. එහෙත් හිත දෙගිඩියාවේය. ඇය විවාහයට හදාගත්තේ බොහෝ දුරටය යන අදහසිනි. එසේ කළේ අම්මාගේ පෙළඹීම නිසාවෙනි. අම්මාගේ අකමැත්තයන් එයට තැබූ දුෂ්කර ඇයි වරෙක ඇයට සිතේ, බොහෝ වෙලාවක් තමාට අම්මාට සැලකිය හැකිවේය යන අදහසින් සිත්ලිලක්, බලාපොරොත්තුවක් ඇය තුළ විය. එහෙත් තමාට අධ්‍යයනය කරන්නට සිදුවූ පොතක ඇතුළත් කරුණක් ඇයගේ මොළය තුළ රැඳුණේම නැත.

"කාන්තා මෙන් පන්නර කළයුතු නොයෑමට" බිමල් තීරණය කළේ හේතු තුනක් නිසාවෙනි. එකක් අම්මාගේ කන් කෙඳිරියයි. බිමල් කාන්තා, ගිය මාසයේ යාමක ළමක් නැතැයි අම්මා එක් එක් ආකාරයෙන්, දුර්වලතා ආකාරයයි. දෙවැනි හේතුව තමා සිතූ පරිදි තමාට කාන්තාගේ ඇසුර නොලැබීමයි. කාන්තාත් බිමලුත් එකිනෙකාට දැඩි ආදරය තැබුවා නොවේ. එහෙත් බිමල් බලාපොරොත්තු වූ, සමීපත්වය ඇයට නොලැබුණේය. අවසන් හේතුව අනුකෝරාළ - ඇගෑ කතා නම්, වෙත ඇය තුළදී අනුරාගයයි. කාන්තාගේ උරුමයෙන් බිමල්ට වී කාසිලයේම ආරම්භක රැකියාවක පිංග පත්වීම දුක් කාල නිවුරුව අනුකෝරාළ වැනි කෙනෙක් පටතේ වැඩ කිරීම ඇයට නොපිළිස්සුම් විය.

"අනේ අනේ මිස්ට අනුකෝරාළට කෝල් කරල අහන්න කාන්තාව කොහෙද ගැව්වේ කියලා ?" සුමනා පිංබොන්දු වූහාය.

"ඇයි අර කතරගම යන අදහසක් කිය කියා හිටියනෙ. අර කතරගම - රාවන සම්බන්ධය ගැන ලියන්න තොරතුරු හොයන්න කියලා."

"අනේ මන්දා - මී උනාට අපිට කෝල් කරනවනෙ!"

"මී උනාට ෆෝන් එක බාප් කරගන්න විදියක් නැතුව

ඇති. "

"ඉතින් තාත්තාට ඕනෑ නං වෙන කෝල් එකකින් අපිට කතා කරනු ඇතිනෙ?"

"අපිට කතා කරන්න ඕනෑ කමක් නැතුව ඇති."

"ඇයි එහෙම කියන්නෙ?"

"දැඩ කාර බැස්සාම සමහර මිනිස්සුන්ට දරු පවුල් අමතක වෙනවා."

"තාත්තා ඒ වගේ කෙනෙක් නෙමෙයි" කී සුනා කොපිස්සුමෙන් ගෙට ගියාය.

සුනාගේ ශාරීරික වේදනාවන් ගැන දැඩිවන්නේ මෙවන් අවස්ථාවලදීය. ඒවා 'මානසික' බව උපසේන රමනින් නොමේ - බිමල් ද සිතයි. සුනා තාකී කරන්නට යන්නේ නැත. ඇගේ වේදනා දන්නේ ඇයම පමණි. ඇය වේදනා නාශක පෙත්තක් ගිල දමා ඇඳට වැටුණාය. මද වේලාවකින්ම ඇය ගැඹුරු නින්දකට ගානු වූවාය.

තැපැල් කරු විශේෂ ලිපියක් ගෙන දොරකඩට ආවේ මේ මොහොතේය.

ලිපිය ලියා තිබුණේ බිමල් නමටය. යතුරු ලියනයකින් කරන ලද ~~[struck]~~ ලිපිනය සහිත දිග සුදු ලියුම් කවරයකි.

බිමල් කවරය විවර කළේ කුතුහලයෙනි.

ඇතුලත තිබුණේ ජායාරූප කීපයකි. ඒවායේ තේමාව එකකි. ගෑණියකුත්, පිරිමියෙකුත් එක් එක් ආකාරයට නිරුවතින් සයනයක සිටින ආකාරයෝය මේ ජායාරූප වල අඩංගු වූයේ. මොහොතකට බිමල්ගේ දෑස් බොඳ විය. ගෑණියත්, මිනිසාත් විවිධ අනංග රංග අවස්ථාවල යෙදී සිටියේ, කාම සූත්‍ර අවස්ථා සිහිපත් කරමිනි. එහෙම නැත්නම් පැරණි හින්දු කෝවිලක පිටත බිත්ති වල කැටයම් වූ සංසර්ග අවස්ථාවන්හි මේ දෙදෙනා නිරතව සිටියහ. තමා තුල ඇතිවූ කම්පනය නිසාත්, විශ්මය නිසාත් බිමල් ජායාරූප දෙස බැලුවේ අමුතුම චින්තනයකින්. එය අධිවේගී රෝලර් කෝස්ටර් විනෝද චාරිකාවක යන විට ඇති වන උත්තේජිත හැඟීමකි. භයක්, යම්කිසි ප්‍රීතියක් - එමෙන්ම කුතුහලයක්.....

අනතුරුව ඔහු එයින් උනන්දුවෙන් පෝස්ටරය දෙස බලන්නට වූයේය. තමාට මේ ඡායාරූප එවන්නේ කවුද? ආවශ්‍ය ලිපිනයක් නම් නැත. අනතුරුව ඔහුට රූප දෙක තුනක එයින් සමීප මුහුණුවර පැහැදිලි වන්නට විය.

මේ කවුද?

ටිකක් - ටිකක් - තාත්තාගේ හැඩරුව --

කවුද මේ තරුණ වගේ ගෑනිය?

තාත්තා කතරගම් යනවා කියා කොහේ හෝ තානායමක ගෑනියක සමඟ කාමර රති රසෝත්සවය ලබනවාද?

නෑ - නෑ තාත්තා මෙන්න බෑ - ඕ නොවේ පොටෝ එකක් මෙන්න ඇති. බිමල්ගෙම යාලුවෙකුගෙ විහිළුවක්, සබාරව්ව වෙන ෆෝටෝ එකක පින්තූර අනේ තාත්තාගෙ මූණ අලවන්න ඇති. ඒත් තාත්තාගෙ මූණ එක එක ආකාරයට ගන්න රූප කොහොම හොයා ගන්නද?

බිමල් යළිත් රූප එකින් එක බලද්දී පටිමම ගතරට තවා තිබූ කුඩා කඩදාසිය ද්‍රවුණේය ~~[illegible]~~ ඔහු එය සොයමින් ඩිග නැමියේය.

එහි ලියා තිබුණේ වචන කීපයකි.

" මෙන්න - තාත්තගෙ වැඩ! "

එහි ලියා තිබුණේ එපමණකි.

"මෙන්න තාත්තගෙ වැඩ·!"

'මගෙ අම්මෝ!' නිමල්ගේ කට කෑගැසුවේය. 'මේවා අම්මා දැක්කා නං .. මළ පූලියයි - මෙගලි වංගලමයයි! ඡායාරූප ටික යළිත් පිරික්සන බලූ බිමල් දැන් පෝස්ටරයට පටන් ගත් අතැඟිලි තුඩින් ඒ කියමල කවරයේ බහාලා කවරය දෙස බැලුවේය.

කොහොම ආ ලියුමක්ද?

මුද්දරයේ සීල් වැදී තිබුණේ දකුණු කලුතරින්.

මේක කාගෙ වැඩක්ද? කාගෙ වැඩක්ද? යන පැනය හදවතේ අඩවෙගි කිගි කිගියට-ම් රිද්මයට පැයෙන පද මාලාවක් මෙන්විය.

ඡායාරූප සහිත කවරය ගෙන නිමල් ඉස්තෝප්පුවේ

පඩිපෙළ බැස ඉදිරි මිදුල හරහා ගේට්ටුව වෙතට ගියේය.
අම්මා නිසැකවම ගෙතුල බව තහවුරුව දැනගන්නට මෙන
ගෙය දෙස බැලූ බිමල් ගේට්ටුවෙන් පිටතට ගොස් කවරය
තුර යළිත් ජායාරූප එකින් එක පිරික්සා බැලුවේය.
අනුමානයක් නෑ! ජායාරූපයෙන්ම ඉන්නේ කාන්තාම
තමා.! ඇය මන් බොරදා? තිවුරන් හෝ ඇගුව මන් කොට
ජායාරූ ගත්තාද? ඒ නැත්නම්-- ඒ නැත්නම් කැමැත්තෙන්ම--
එහෙම නම් මේ කාම ධේනුවක් වන් ගැහැනිය
කවුද? 'දකුණු කලුතර'? -- කාන්තා කතරගම් යනවා
කියා කල සූව කරන්නට ඇත්තේ මේ දැයේ වෙන්නැති.
සමහර විට කෙනෙක් ඇගුව ලිගුකම අවවන්නට මෙය
කල සූව කරන්නට ඇති. ඒත් මොනවා ලබා ගන්නද?
කාන්තා ධනවතෙක් නොවේ. තමා ධනවතෙකුත් නොවේ.
බ්ලැක් මේල් කරලා සල්ලි ගන්න නම්-- කා ළඟ තියෙන
සල්ලියක්ද? සමහර විට කාන්තා සමඟ වැඩ කරන
උඩින් මිතුරු යටින් හතුරු කරා කාරයෙක්...
එහෙමත් නැත්නම් කාන්තා දන්නවාම වෙනත්
ගැහැනියක හා සම්බන්ධව පළා යන්නට ඇති. ගෙදරට
කියා ගන්න බැරි නිසා මේ විදිහට ලියුමක් එව්වාද? නෑ
එහෙම නම් ඒත් පින්තූර එව්වේද? මේ වගේ පින්තූර..
මේවා කැබරේයක ගත්ත ඔහේල් පින්තූර නෙමෙයිනේ!
මේකත් එක්තරා විදිලක පින්තූර තමයි.!
එදා රාත්‍රියේ බිමල්ට හරි හැටි නිදාගත නොහැකි විය.
ඇය ඒ ජායාරූ සියල්ල තම කාමරයේ ලාච්චුවක සඟවා
යතුරු ලෑවේය. මේ ගැන විමසන්නට කෙනෙකුත් නෝය.
සාකලේ බිමල්ට සමීපතම මිතුරන් දෙදෙනෙක සිටිති. සමීරන්
නම් එක් මිතුරෙක විනාගයෙන් පසුව කතරගම තම ගමේ
ගොසිනි. අනෙක් මිතුරා - ජලිත බිමල්ට විටින් විට මුණ
ගැසෙයි. එහෙත් ජලිත විශ්වාසකට මේ ගැන කිව නොහැක.
මේ ජායාරූප පෙන්වීමත් කොන තරම් ලජ්ජාවට කරුණක්ද?
කාන්තාට සිදුවූ දෙයවත් එයා දැන් සිටිනදැයි දැනගත
යුතු වූයේ මේ ජායාරූපයේ ගැහැනිය කවුද යන්නයි. මේ ජායාරූ
ගත්තේ කොහේද? කවුද යන්න දැන ගැනීමේ අවශ්‍යතාවය, කුතුහලය
අනෙක් හැම අභිබවා ගියේය.

රාත්‍රිය පුරා හරි හැටි නිදාගත නොහැකිව නිමල් ඇඳෙහි දඟ බෑහ පෙරළුනේය. නින්දට වැටුණත් ඔහු දුටුවේ නානාර්ථ සම්බන්ධ සිහිනයන්ය. එක් සිහිනයක උපසේන කවුද්දේ ගුහාද්වාරයක සමාන දේවාලයකට ඇතුළු වූයේය. දේවාලයේ සිවිලිම උස බිත්ති මුදුන් කොටස් වල දිගටම අඳා තිබුණේ ස්ත්‍රී පුරුෂ සංසර්ග අවස්ථාවන්ය. චිත්‍ර කිසිවක් නැරඹුවේ නොවීය. තවත් සිහිනයක දෙවොලක ද්වාරපාලකයේ ආරුක්කුවක් මත ශුන්‍යාගාරයක වැතිර සිටියේය. ඔහු විෂ කන්‍යාව කිය නාගයක් නිමල්ට ඇනීවිය. සතුරු ගණිකාවන් හා ඝාතකයන්ට කුඩා කලම සිට ශරීරයට විෂ බිඳු බිඳු පොවා මල්වර වූ තරුණියන් ගැන කතන්දරයක් නිමල් කියවා තිබිණි. මේ විෂ කන්‍යාව හා සංසර්ගයෙන් මිනිසෙකු ජීවිතාන්තයට පත්වේ. විස දර ගත හොත් මිය යයි. මේ සිහිනයේ නිමල් දුටුවේ කාන්තාව වැතිර සිටි පුවරුව මත එන උපසේනයි. උපසේන කාන්තාවගේ ඇඟට අත තැබීම තමයි. ඔහු එතැනම මැරී වැටුණේය!

නිමල් හීන් දාඩිය වගුරුවමින් අවදි වූයේය. එතැර චිරකාලයක්ම නැවත නින්දට ගිය ඔහු තවත් සිහිනයක අවිනිශ්චිත දිය කඳක් දුටුවේය. උපසේන එහි ඔහුව ගොඩ ගන්නට දඟලනු පෙනුණි.

පසුවද අළුයමින්ම ඇඳෙන් නැගී නිමල්ට දැඩි කෙන්දිරුණ ගතියක් දැනුණි. නිදාගෙන සිහින දුටු අවස්ථාවන්ට වඩා ඔහුට සිතුණේ තමාට නිදාගත නොහැකි බවයි.

කුස්සියට ගිය නිමල් කේතලය ලිප තැබුවේය. අම්මාටත්, සීනි රහිත තේ කෝප්පය සාදා දෙන්නේ නිමල්ය. ඇද කේතලය නටන අතරේ නිමල් සිතුවේ කලුතර යන ගමන ගැනය. තව, කලුතර ගොස් කුමක් සොයන්නද? කොහේ සොයන්නද? දැනට කලුතර නෑලා කාර්යාලයට ගියා කියා එතැන අය මොන තොරතුරක් සපයන්නද?

කේතලය නටන්නට විය. නිමල් කල්වනාගෙම තේ වත් කෙරුවේය. තමා කොයිකටත් කලුතර යන්නට ගොස් ඇවිද බලිය යුතු යැයි ඔහු තීරණයක් ගත්තේය. අම්මා ගෙදර තනිකර දමා යා නොහැකිය. ඒත් වෙට ඇයට තනි රැකෙන්නේ එහා ගෙදර පද්මා අක්කාය. පද්මා අක්කා ජීවත්වන්නේ ඇගේ නැගණිය සුලෝචනා හා ඇගේ අම්මා සමඟයි. සුලෝචනා තවම පාසල් යන්නිය. සුලෝචනා නිමල්ට වඩා දුවිලිද්දක් කරම

බාලයේ. පන්තියට ඇතුළු වූ සුලෝචනාව නිමල් දකින්නේ කලාතුරකිනි. පද්මා අක්කා නම් ඇවිදුම මෙන් නිමල්ගේ අම්මා දකින්නට එයි. ඇය හා කෙටි බස් කරමින් සිටියි. වෙනත්විට පද්මා අක්කා නැතත් කෙනෙක්, සෙනසුරාදාවක ඇය නිමල් ලාගේ ගෙදරට ගෙනවිත් දෙයි.

නිමල්ට, පද්මාහට කියා, කලුතර ගොස් ආ දැකිය. ඒ බව් පසු නිමල් පද්මා සොයා ගියේය.

ගෙදර සිටියේ සුලෝචනාත්, අම්මාත් පමණි. පද්මා අක්කා ගමනක් ගියා යි සුලෝචනා කීවාය. සුලෝචනා නාසැලේ යන්නට සැරසීලාය. සුදු ගවුමෙන් සැරසී සිටින ඇය හරිම ලස්සනයි.

"නංගි - අක්කා එන්නෙ කවදද?"

"මි.. අද නං එන එකක් නැහැ."

"කොහේද ගියෙ?"

"නෑදෑ ගෙදරක -

සුලෝචනාගෙන් එක වචනේ පිළිතුරක් ලබා ගැනීම අසීරුය. උත්තරයක් ලබා ගැනීමට ප්‍රශ්න දාමයක් දැමිය යුතුයි.

"මොට ඒවිද?"

"මි-- කියන්න බැහැ."

"දුරකද ගියෙ?"

"නෑ ඒ තරම් දුරක් නෙමෙයි."

"කොහේද?"

"මි-- කලුතර.."

කලුතර? පද්මා අක්කා ගිහින් තියෙන්නේත් කලුතර, ලියුමත් කලුතරින් - මේ දෙකේ සම්බන්ධය කුමක් තියෙනවාද?

"කවුද නංගි කලුතර ඉන්නෙ?"

"මි- නෑදෑ කෙනෙක්."

"කලුතර- දකුණද උතුරද?"

"අනේ නිමල් අයියා ඔක්කොම හැම එකම දැනගන්න ඕනෑනෙ?" මෙවර සුලෝචනා තොරිස් සුසුමෙන් කීවාය

"මං යනවා අයියා- ඉස්කෝලෙ යන්න පරක්කු වෙනවා."

"හා- හා"

සුලෝචනා අනුව නිමල්ට සරට ආවේය, ඈ ඈතට

යනු බලා සිටි ඔහුට මහා හිස් බවක් දැනුණි.
අනතුරුව එක්වරම සිත යළිත් කාන්තා වෙතට ගියේය.
තමාට කෙදිනක යන ගමන නම් දවසක් වත් එක වෙයි

කැඳවූවත නොදැනීමෙන් ඔහුට එවන් හැඟීමක් ඇතිවිය.
තමාට අම්මාට මේ කිසිවක් හෙළි කළ නොහැකිය. ඇයට
තවත් අසනීප වේවි-- මේ සේයාව දන්නකොටම්-- ඇයට
මොනව කියා මොනවා වේවිද?

ජීවිතය ගුළිකරන්න දැමිය නොහැකිය. මේවා සාමාන්‍ය
වශයෙන් කතාගත යුතුය. යම් කිසි දවසක--- අවශ්‍ය වුනොත්..

අනතුරුව- තමාට කිසි දිනක කාන්තා දකින්නට
නොලැබෙය යන සිතියක් ඔහු තුළ උපන්නේය. එහෙම උනොත්...
දැනමම ඔහු අනතුරකෙය. දැනටමත් ඔහු ජීවිතත් අතරින්
සැඟවුනොද?

නිමල් අම්මාට දවල් ආහාර පිළියෙළ කර දුන්නේය.
බේත් බොන්න වෙලාවට දුන්නේය. එහෙත් නිමල්ට හරි හැටි
කෑම කන්නට නොහැකි විය.

"අම්මේ මං නගරෙ ඇවිදින්න යනවා," හවස් වරුවේ
නිමල් සූසාට කියා මහ පාර අතට ඇවිද ගියේය.

ලෝකය කිසි නොසැලෙන ගැටුවක් මෙන්
පෙරදා පුරුදු පරිදි රථවාහන ගමන් ගනියි. මිනිස්සු ඔබ
මොබ හැසිරෙති. එකම වෙනස නිමල්ගේය. ඔහු බොහෝ
වේලාවක් පාර දිගේ ඇවිදගෙන ගියේය. තමා අරමුණු නැති
දෝංකාරයක් මෙනි.

අවට අඳුර දැකීමෙන් පසු ඔහුට වටහීමක් නොවී-
පෙරලා ගෙදර ආ ඔහු අම්මාට බත් උයාදී තමාද යමක් රස
කරගත්තේය.

"මොකද පුතා, ප්‍රශ්නයක්ද?" සූසා රාත්‍රී කෑම
මේසය මතදී ඇසුවාය.

"නෑ- නෑ- නෑ-"

'මොකක් හරි ප්‍රශ්නයක්- පුතා කාන්තා හා
ආරවුලක් ආවද?" සූසාගේ කට හඬ ගැස්සුණි.

"නෑ නෑ- නෑ.. - මට- මට."

"ඇයි?"

"මට කොහේ හරි ගිහින් එන්න තියනවා"

20 කොටස



"කොහේද?" සුජාතා කලබලේ වගේ ඇසුවාය

"මං දන්නෙ නෑ අම්මා - මේකට විසඳුමක් හොයන්න."

"මොකක්කටද?" දැන් සුජාතා හඬන්නීය.

විමල්ගේ දෑසටත් කඳුළු පිරෙන්නට විය.

"තාත්තව හොයන්න -"

"කොහේ කියලද?"

දෙදෙනාම කඳුළු වැගෙව්වී.

"කතරගම නෙ යන්නේ කිව්වෙ - - ඉතිං"

"ඉතිං?"

"කතරගමටම යන්න."

"අනේ පුතා - මිස්ට අතුකෝරාලම කතා කරන්නකෝ."

"මට - - -"

"අනේ කතා කරන්න - කතා කරන්න" කඳුළු අතරින්ම සුජාතා පිංසෙන්දු වූවාය. එවිටත් නොවේ - ඈ විමල් වෙතට ලංව ඔහුගේ හිස අතගාන්නට වූවාය.

අම්මාගෙන් හැලහොතට මෙන් පුදුමෙන් නැගිටගත් විමල් දෑසේ කඳුළු පිසදාගෙන දුරකතනය වෙතට ගියේය. ඔහු අතුකෝරාලගේ දුරකතන නොම්මර [illegible] නිසාවෙනි.

අතුකෝරාලගේ ගාම්භීර හඬ එහා පසින් ඇසුණි.

"හලෝ?"

"මිස්ට අතුකෝරාල - මේ විමල් - උපසේනගෙ පුතා!"

"මොකද බං."

"අනේ තාත්තා - - -"

"එයා මෙහේ නෑ -"

"මීට කලින් එයා මෙහෙත් නෑ - ගෙදර ආවෙත් නෑ -"

"ආ, එහෙමත් එකක්ද?"

"ඔව් මිස්ට අතුකෝරාල. තාත්තා කතරගමද?"

"මං දන්නෙ කොහොමද උඹයෝ?

"එයා ගෙදර ආවෙ නෑ-නෑ"

"මං එයාව අස්කෙරුවා"

"අස් - කෙරෙව්වා?"

"ඔව්. මිනිහ මෙහෙ කාගෙද සෙතක් ලියන්න වේ සේරම දාල ගහල ගියා."

"ඒ කවුද ?"

"මට දැන් මතක නෑ... මෙහෙම කියල තිබ්බා - මං මිනිහව අස් කෙරුවා."

"මිස්ට අනුකෝරාල - තාත්තා එහෙම කරපු කෙනෙක් නෙමෙයි."

"මං කොහොමද දන්නෙ ? මිනිහා මට රෝස්තියාදු කෙරුවා. කොහේ හරි මාළුවක ගාණ වගේ මට කතා කෙරුවා - මං කිව්වා අස්කරලා කියලා. වගකීමක් නැති මිනිහෙක්."

"සරි - මොකක් හරි වෙලා තියෙනවා."

"මං දන්නෙ කොහොමද ළමයො ? මම කතා කරපු වෙලාවෙ - මොනවද කියවන්න ගන්නා..."

"පෙතක් ලියනව කිව්වෙ ? කාටද ? කොහෙද ?"

"මං දන්නෙ නෑ ඇද ලියුමක් ඇවිත් තියෙනවා - ඔෆිස් එකට."

"තාත්ත ලියපු ලියුමක් ?"

"ඒක මං දන්නෙ නෑ - ටයිප් කරපු ලියුමක්."

"හා - රි -"

බිමල් තව යමක් කියන්නට පෙර දුරකතනය විසන්ධි විය.

"ඇයි පුතා ?" සුජා ඒ ළඟම සිට ඇසුවාය.

"තාත්තව අස් කරලා"

"මොන හේතුවකටද ?"

"තාත්තා කාගෙද පෙතක් ලියන්න යනව කිව්වලු."

"කාගෙද ? කොහෙද ?"

"මම - කොහොමද දන්නෙ ?" කී බිමල් තරහින් බොත්තම් ටිකත් පියාගෙන ගෙයින් එළියට බැස්සේය.

නැවත දැනටමත් වල, යමට හරිතේ බිමල්ට සිතුණි.

ඊත් - කොහේ කියා යන්නද ?